ප්‍රවෘත්ති අධ්‍යක්‍ෂ/ප්‍රවෘත්ති සංස්කාරක 2023 පෙබරවාරි 21

# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2021 = 100) : 2023 ජනවාරි

### ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

### මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

දුරකථනය: 011-2147414 ෆැක්ස්: 011-2877945 ඊමේල්: prices@statistics.gov.lk

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ 2013=100 වූ දර්ශක යොමු කාලය 2023 ජනවාරි මාසයේ සිට 2021=100 වන නව දර්ශක යොමු කාලයට යාවත්කාලීන කර ඇත. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ජාතික පාරිභෝගික මිල දර්ශකය මාසිකව නිකුත් කරනු ලබන අතර, 2023 ජනවාරි මාසයේ ලක්‍ෂ්‍යමය මතුපිට උද්ධමනය (Headline Inflation) 53.2%ක් බව එහි අධ්‍යක්‍ෂ ජනරාල් මෙම නිවේදනය නිකුත් කරමින් සඳහන් කර ඇත. 2023 ජනවාරි මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 24.2%ක හා ආහාර නොවන කාණ්ඩයේ 29.0%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. 2022 ජනවාරි මාසයට සාපේක්ෂව 2023 ජනවාරි මාසයේ උද්ධමනය වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ආහාර හා ආහාර නොවන කාණ්ඩවල පැවති ඉහළ මිල මට්ටම් ය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (2021=100) මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2022 දෙසැම්බර් මාසයේ 200.4ක් වූ දර්ශකාංකය 2023 ජනවාරි මාසයේ දී 201.8ක් දක්වා වැඩිවීමක් වාර්තා විය.පසුගිය මාසය හා සංසන්දනය කල විට 2023 ජනවාරි මාසයේ දර්ශකාංකය 1.4ක වැඩිවීමක් එනම් 0.69ක ප්‍රතිශතාංක වැඩිවීමක් වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ දර්ශක අගය 0.08% කින් වැඩිවීම සහ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය 0.61% කින් වැඩිවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩය සැළකූවිට පොල්, මාළු, එළවළු, තේ කොළ/කුඩු, පොල්තෙල්, අමුමිරිස්, රතුළූණු, බිත්තර, අළුත් පළතුරු, කිරිපිටි, කවුපි, කඩල සහ මුංඇට යන ආහාර ද්‍රව්‍යවල මිලෙහි වැඩිවීමක් ප්‍රධාන වශයෙන් වාර්තා වී ඇත. එහෙත් කරවල, පාන්(සාමාන්‍ය), කුකුල්මස්, තිරිඟුපිටි, දෙහි, හාල්, අර්තාපල්, ටින්මාළු, සීනි, වියළි මිරිස් සහ තුනපහ කුඩු යන ආහාර ද්‍රව්‍ය වල මිලෙහි අඩුවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2023 ජනවාරි මාසයේ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය වැඩිවීම සඳහා 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය' (*අරක්කු, දුම්වැටි*), 'රෙදිපිළි හා පාවහන්', 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු', 'සෞඛ්‍ය' (පෞද්ගලික වෛද්‍ය ගාස්තු), 'විනෝදාත්මක හා සංස්කෘතික' (අභ්‍යාස *පොත් සහ ලිපිද්‍රව්‍ය*), 'අධ්‍යාපන' (පෙර පාසල් ගාස්තු, අමතර පන්ති ගාස්තු, උසස් අධ්‍යාපන පාඨමාලා ගාස්තු), 'ආපනශාලා සහ හෝටල්' සහ 'විවිධ භාණ්ඩ හා සේවා' (*රැවුල කපන උපකරණ හා ක්‍රීම් වර්ග*) යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිල වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. එසේ වුවත් පසුගිය මාසය හා සංසන්දනය කලවිට 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන' (*ගොඩනැගිලි ද්‍රව්‍ය, ගෑස් සහ භූමිතෙල්*) සහ 'ප්‍රවාහන' (ඩීසල් සහ ගුවන් ගමන් ගාස්තු) යන කාණ්ඩවල අයිතමයන්ගේ මිලෙහි අඩුවීමක් වාර්තා වී ඇත. එමෙන්ම 'සන්නිවේදන' කාණ්ඩයට අයත් අයිතමයන්ගේ මිල ජනවාරි මාසයේ නොවෙනස්ව පැවති බව වාර්තා වී ඇත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (පාද වර්ෂය: 2021=100) ලක්‍ෂ්‍යමය වෙනස්වීම් පදනම්ව නිතර මිල උච්ඡාවචනය වන ආහාර වර්ග, බලශක්ති සහ ප්‍රවාහන අයිතමයන් ඉවත් කිරීමෙන් පිළිබිඹු වන යටිදැරි උද්ධමනය (Core Inflation), 2023 ජනවාරි මාසයේදී 52.0% ලෙස වාර්තා විය.

**ජාතික පාරිභෝගික මිල දර්ශකය, ජාතික පාරිභෝගික මිල දර්ශකය (යටිදැරි) (පදනම:2021=100) සහ ජාතික පාරිභෝගික මිල දර්ශකය, ජාතික පාරිභෝගික මිල දර්ශකය (යටිදැරි) (පදනම:2013=100)**




## ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2021 = 100)

| වර්ෂය | මාසය | දර්ශකාංකය | | | | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | | ලක්ෂ්‍යමය උද්ධමනය (%) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) | | | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) |
| | | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | |
| **2022** | ජන. | 131.7 | 151.6 | 118.9 | 124.9 | | | | | | |
| | පෙබ. | 132.9 | 153.1 | 119.8 | 126.2 | 0.9 | 1.0 | | | | |
| | මාර්තු | 137.3 | 156.9 | 124.6 | 130.4 | 3.3 | 3.3 | | | | |
| | අප්‍රේල් | 151.7 | 176.1 | 136.0 | 142.8 | 10.5 | 9.5 | | | | |
| | මැයි | 166.3 | 195.3 | 147.6 | 154.5 | 9.6 | 8.2 | | | | |
| | ජූනි | 183.5 | 222.8 | 158.2 | 167.5 | 10.3 | 8.4 | | | | |
| | ජූලි | 193.1 | 233.4 | 167.1 | 176.8 | 5.2 | 5.6 | | | | |
| | අගෝ. | 197.7 | 237.5 | 171.9 | 181.2 | 2.4 | 2.5 | | | | |
| | සැප්. | 201.9 | 239.1 | 178.0 | 185.9 | 2.1 | 2.6 | | | | |
| | ඔක්. | 201.6 | 236.5 | 179.1 | 188.0 | -0.1 | 1.1 | | | | |
| | නොවැ. | 200.3 | 233.2 | 179.1 | 187.8 | -0.6 | -0.1 | | | | |
| | දෙසැ. | 200.4 | 232.4 | 179.8 | 188.0 | 0.0 | 0.1 | | | | |
| | ජන. | 201.8 | 232.8 | 181.8 | 189.8 | 0.7 | 1.0 | 53.2 | 53.6 | 52.9 | 52.0 |

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව